මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ
අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ශ්‍රේණියෙහි සත්ව සංවර්ධන උපදේශක තනතුර සඳහා වන
බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම
සංශෝධනය -01

| සංශෝධනය වන ඡේද | දැනට තිබෙන පිළිවෙල | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතුව |
|---|---|---|---|
| ඇතුළත්ව නැත. | අන්තර්කාලින විධිවිධාන යටතේ 17.4 ලෙස ඡේදයක් දැනට ඇතුළත්ව නැත. | 17.4 මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට III වන සහ II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වන නිලධරයන් උසස්වීම් ලබා දීමේදී අන්තර්කාලය තුළදී අදාළ කර ගත යුත්තේ 2000 මාර්තු මස 20 දිනැතිව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 8.1 (අ) සහ 8.2 (අ) වගන්ති වේ. මෙම අන්තර්කාලින විධිවිධානය 2018.06.01 දින දක්වා බලපැවැත්වේ. (මෙම අන්තර්කාලින විධිවිධාන අදාළ වන්නේ 2013.06.01 දින සිට ක්‍රියාත්මක තාක්ෂණ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර පැවති 2000 මාර්තු මස 20 දිනැතිව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවා ව්‍යවස්ථාව යටතේ බඳවා ගත් නිලධරයන් සඳහා පමණි.) | සත්ව සංවර්ධන උපදේශක තනතුර මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ තනතුරක් බැවින් එම පරිපාටියට 2013.06.01 දින සිට ක්‍රියාත්මක මධ්‍යම පළාත් තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ අංක 15 යටතේ සඳහන් අන්තර්කාලින විධිවිධාන ඇතුළත් කිරීම. |

කොමිෂන් සභාවේ නිර්දේශය:- නිර්දේශ කරමු.

01. ගාමිණී දසනායක මහතා (සභාපති) ........................

02. යූ.ඒ. බෝගහපිටිය මහතා (සාමාජික) ........................

03. ජී.ජී.එස්.ඒ. දිසානායක මහත්මිය (සාමාජික) ........................

04. වී. නන්දකුමාර් මහතා (සාමාජික) ........................

05. ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා (සාමාජික) ........................

දිනය:-2016.06. 28

අනුමත කරමි/නොකරමි.

........................
මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය

දිනය:- 2016-07-28

නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
මහනුවර.